දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல. / My No.: PSC/APP/HB/31/2023

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2026 ජූනි මස 01 දින

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 04/2023 (I)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2023.10.11 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයෙහි 05 සහ 06 වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

**05. පත්කිරීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන්ගේ (නිලධාරී සංචිතය) ලැයිස්තුවක් සකස් කිරීම.**

5.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 120% ප්‍රමාණයක නිලධාරීන් සංඛ්‍යාවක් ඇතුළත් කර, පත්කිරීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ ලැයිස්තුවක් සකස් කරනු ලැබේ.

**06. තනතුරට පත්කිරීම**

6.2 සංචිතය සඳහා තෝරා ගැණුනු සියලුම නිලධාරීන් පුරප්පාඩු වී ඇති සියලුම තනතුරු සඳහා තම මනාපය අනුපිළිවෙලින් සටහන් කළ යුතුවේ. යම් නිලධාරියෙක් සියලුම පුරප්පාඩු තනතුරු සඳහා ප්‍රමුඛතාවය අනුව මනාපයන් සඳහන් නොකරන්නේ නම් එකී නිලධාරීන් එම තනතුරු සඳහා පත්කිරීමට සළකා බලනු නොලැබේ. එම නිලධාරීන්ගේ මනාපයන් සළකා බලා ඒ ඒ ආයතනයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා සංචිතයෙන් සුදුසු නිලධාරියකු තෝරා ගැනීමේ බලය අදාළ ආයතන ප්‍රධානීන් සතු වේ. අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කිසිදු නිලධාරියෙකු පත්කිරීම සඳහා නිර්දේශ නොකරන අවස්ථාවන්හි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකී පත්කිරීම සිදු කරනු ලැබේ.

03. ඉහත චක්‍රලේඛයෙහි සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම ක්‍රියාත්මක වේ.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව